සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	11 ශ්‍රේණිය	විද්‍යාව -I	කාලය நேரம் Time	පැය 01යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, පිළිතුරු සඳහා (1),(2),(3),(4) ලෙස වරණ හතර බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සඳහා නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුරට අදාළ වරණය තෝරා ගන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා ඔබ තෝරාගත් වරණයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) යොදන්න.**

---

1. මිනිස් දේහයේ යූරියා නිපදවන ඉන්ද්‍රිය වන්නේ,
(1) ආමාශය යි. (2) අග්නාශය යි. (3) වෘක්කය යි. (4) අක්මාව යි.

2. සෛලයක ජල තුල්‍යතාවය පවත්වා ගැනීමට දායක වන ඉන්ද්‍රිකාව/ ව්‍යුහය වනුයේ,
(1) සෛල ප්ලාස්මය යි. (2) රික්තකය යි.
(3) න්‍යෂ්ටිය යි. (4) ගොල්ගි සංකීර්ණය යි.

3. පොලිතීන්වල අඩංගු මූලද්‍රව්‍ය වන්නේ,
(1) C හා H ය. (2) C ,H හා O ය. (3) C ,H හා N ය. (4) C ,H හා S ය.

4. නිව්ටන් තරාදියක 10 N බර වස්තුවක් එල්ලා ඇත. එයට තවත් 200 g ක වස්තුවක් පහළින් එල්ලූවිට නව පාඨාංකය කුමක් ද?
(1) 10.2 N (2) 12 N (3) 21 N (4) 210 N

5. ස්වයංපෝෂී නොවන ජීවීන් ඇතුළත්වන පිළිතුර තෝරන්න.
(1) බැක්ටීරියා හා ප්ලාන්ටේ (2) ප්ලාන්ටේ හා ෆන්ගයි
(3) ඇනිමාලියා හා ෆන්ගයි (4) ප්‍රොටිස්ටා හා බැක්ටීරියා

6. වස්තුවක් මත ක්‍රියාකරන ඝර්ෂණ බලය පිළිබඳ **අසත්‍ය** ප්‍රකාශය වන්නේ,
(1) චලිතය වන වස්තූන් මත ඇති වන්නේ ගතික ඝර්ෂණ බලය යි.
(2) ඝර්ෂණ බලයට ගතහැකි උපරිම අගය සීමාකාරී ඝර්ෂණ බලය යි.
(3) ඝර්ෂණ බලය සෑම විට ම සමස්ත වස්තුවේ චලිතයට විරුද්ධව ක්‍රියා කරයි.
(4) බලයක් යෙදූවත් චලිතය නොවන වස්තු මත ඇතිවන්නේ ස්ථිතික ඝර්ෂණ බලය යි.

7. ප්‍රභාසංස්ලේෂණය පිළිබඳ නිවැරදි වගන්තිය කුමක් ද?
(1) සෑම ශාක පත්‍රයකම ප්‍රභාසංස්ලේෂණය සිදු වේ.
(2) ශාක පත්‍රයක සෑම තැනකම ප්‍රභාසංස්ලේෂණය සිදු වේ.
(3) ප්‍රභාසංස්ලේෂණය සඳහා සූර්යාලෝකය අත්‍යවශ්‍ය වේ.
(4) ප්‍රභාශ්ලේෂණය සඳහා කාබන්ඩයොක්සයිඩ් අත්‍යවශ්‍ය වේ.

8. වායුමය ප්‍රතික්‍රියක සහභාගීවන ප්‍රතික්‍රියාවක සීඝ්‍රතාවය වැඩිකර ගැනීමට භාවිත කළ **නොහැක්කේ,**
(1) උත්ප්‍රේරක භාවිත කිරීම. (2) පීඩනය අඩු කිරීම.
(3) උෂ්ණත්වය වැඩි කිරීම. (4) වායුමය ප්‍රතික්‍රියක අඩංගු බඳුනේ පරිමාව අඩු කිරීම.

9. පහත දක්වා ඇති විද්‍යුත් චුම්බක තරංග සලකන්න.
A සූක්ෂම තරංග *B* පාරජම්බුල තරංග *C* දෘශ්‍ය ආලෝකය
මේවායේ තරංග ආයාමය වැඩිවන පිළිවෙළ දක්වන පිළිතුර පහත කවරක් ද ?
(1) *B,A,C* (2) *C,B,A* (3) *A,C,B* (4) *B,C,A*

10. සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් 10 g ක් ජලයේ දියකර පරිමාව 200 cm^3ක් වන ද්‍රාවණයක් සාදා ඇත. එම ද්‍රාවණයේ සාන්ද්‍රණය කොපමණ ද?
(1) 0.5 mol dm^{-3} (2) 0.1 mol dm^{-3}
(3) 1.25 mol dm^{-3} (4) 1.5 mol dm^{-3}

Past Papers Wiki

11. පරිසර පද්ධතියක ඒකක ක්ෂේත්‍රඵලයක ජීවත්වන ශාක සංඛ්‍යාව ගණන් කරන ලදී. එම සංඛ්‍යා පහත වගුවේ දැක්වේ.

ශාක වර්ගය	සෙලජිනෙල්ලා	ෆයිනස්	තෘණ	පොල්පලා
සංඛ්‍යාව	4	1	6	4

අදාළ ක්ෂේත්‍රඵලය තුළ බීජ හටගන්නා ශාක කොපමණ තිබේ ද?

(1) 5 (2) 10 (3) 11 (4) 15

12. කාමර උෂ්ණත්වයේ තිබූ ප්ලාස්ටික් කැබැල්ලක් සහ යකඩ කැබැල්ලක් අතින් ස්පර්ශ කළ විට යකඩ කැබැල්ල සීතලට දැනීමට හේතුව විය හැක්කේ,

(1) යකඩ හොඳ තාප සන්නායකයක් නිසා
(2) ප්ලාස්ටික් හොඳ තාප සන්නායකයක් නිසා
(3) යකඩ කැබැල්ල සීතල වී තිබූ නිසා
(4) යකඩ කැබැල්ලේ සිට අතට තාපය ගමන් කළ නිසා

13. ජීවීන්ගේ පොදු ලක්ෂණයක් **නොවන්නේ,**

(1) සෛලීය සංවිධානය යි. (2) ස්වසනය යි.
(3) ප්‍රජනනය යි. (4) ප්‍රභාසංස්ලේෂණය යි.

14. සංයෝගයක් අම්ලයක් ලෙස හඳුනා ගැනීමට යොදා ගත හැක්කේ පහත ඒවායින් කවරක් ද?


- A පිනෝප්තැලීන් දැමූ විට අවර්ණ වීම
- B ක්ෂාර සමඟ ප්‍රතික්‍රියා කර ලවණ හා ජලය සෑදීම
- C ඕනෑම ලෝහයක් සමඟ ප්‍රතික්‍රියා කර H_2 පිට කිරීම

(1) A පමණි (2) B පමණි (3) C පමණි (4) A,B,C සියල්ලම

15. විභාජක පටකවල ලක්ෂණයක් **නොවන්නේ** පහත කවරක් ද?

(1) හරිතලව නොමැති වීම (2) සෛල සජීවී වීම
(3) න්‍යෂ්ටිය විශාලව පැවතීම (4) සෛල විශාල වීම.

16. රූපය සංකේතයෙන් දැක්වෙන ට්‍රාන්සිස්ටරය හා එහි ධාරාව ගැලීම සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශය කුමක්ද ?



(1) ට්‍රාන්සිස්ටරය npn වේ. සංග්‍රාහකයේ සිට විමෝචකයට ධාරාව ගලයි.
(2) ට්‍රාන්සිස්ටරය npn වේ. විමෝචකයේ සිට සංග්‍රාහකයට ධාරාව ගලයි.
(3) ට්‍රාන්සිස්ටරය pnp වේ. සංග්‍රාහකයේ සිට විමෝචකයට ධාරාව ගලයි.
(4) ට්‍රාන්සිස්ටරය pnp වේ. විමෝචකයේ සිට සංග්‍රාහකයට ධාරාව ගලයි.


17. ඒකාකාර ඝනකම සහිත සෛල බිත්ති දරන මැද කුහරයක් සහිත සෛල අඩංගු පටකය වන්නේ,

(1) මෘදුස්තර ය. (2) ස්ථූල කෝණාස්තර ය. (3) දෘඩස්තර ය. (4) කැම්බියම ය.

18. ග්ලූකෝස් මවුල එකක අඩංගු කාබන් පරමාණු සංඛ්‍යාව වනුයේ,
(ග්ලූකෝස්වල මවුලික ස්කන්ධය 180 $g\ mol^{-1}$)

(1) $6.022 \times 10^{23} \times 180$ (2) $6.022 \times 10^{23} \times 6$ (3) $\frac{6.022 \times 10^{23}}{6}$ (4) $\frac{6.022 \times 10^{23}}{180}$

19. කාච භාවිත කරමින් ආලෝක කිරණ වර්තනය වන ආකාරය දැක්වෙන රූප සටහනක් පහත දැක් වේ. එහි දී භාවිත කර ඇති කාච වර්ග පිළිවෙලින් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?



(1) A උත්තල කාචය B අවතල කාචය
(2) A අවතල කාචය B උත්තල කාචය
(3) A අවතල කාචය B අවතල කාචය
(4) A උත්තල කාචය B උත්තල කාචය

20. මිනිස් ආහාර ජීර්ණ ක්‍රියාවලියේ දී ආම්ලික මාධ්‍යයේ හා භාස්මික මාධ්‍යයේ ක්‍රියා කරන එන්සයිම පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද?


(1) පෙප්සීන් හා ට්‍රිප්සීන් (2) ඇමයිලේස් හා ට්‍රිප්සීන්
(3) ට්‍රිප්සීන් හා ලයිපේස් (4) ඇමයිලේස් හා පෙප්සීන්

21. පහත සඳහන් සියලුම අණු සම්බන්ධ සත්‍ය ප්‍රකාශය මින් කුමක් ද?

• CH_4 • H_2O • HCl • H_2


(1) පරමාණු අතර තනි බන්ධන පමණක් ඇත. (2) එකසර ඉලෙක්ට්‍රෝන යුගල බැගින් ඇත.
(3) කාමර උෂ්ණත්වයේ දී වායු වශයෙන් ඇත. (4) ධ්‍රැවීකරණය වූ බන්ධන ඇත.

22. පහත දැක්වෙන්නේ බවුසර් හතරක ජලය මට්ටම පිරී පවතින ආකාර හතරකි. ඉන් මන්දනයෙන් ගමන් කරන බවුසරය වන්නේ කුමක් ද?



(1) (2) (3) (4)

23. පහත දැක්වෙන්නේ පදාර්ථයේ මූලික තැනුම් ඒකකයක ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන හා නියුට්‍රෝන පිහිටන ආකාරය යි. මෙම මූලික තැනුම් ඒකකයක විය හැක්කේ,



(1) Na (2) Ne (3) Na^+ (4) Mg^{+2}

24. බල තුනක් යටතේ සමතුලිත වස්තුවක් මත ක්‍රියාකරන බල සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) බල පද්ධතියේ ඇති බල විශාලත්වයෙන් සමාන වීම. (2) බල එකිනෙකට ප්‍රතිවිරුද්ධ වීම.
(3) බල සියල්ලම ඒක රේඛීයව පැවතීම. (4) බල සියල්ලේම සම්ප්‍රයුක්තය ශූන්‍ය වීම.

25. නිරෝගී පරිණත කාන්තාවකගේ ආර්ථව චක්‍රය හා සම්බන්ධ හෝමෝන පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ

(1) 14 වන දින වන විට *LH* සාන්ද්‍රනය පමණක් වැඩි වේ.
(2) 14 වන දින වන විට *FSH* සාන්ද්‍රනය පමණක් වැඩි වේ.
(3) 14 වන දින වන විට *LH* හා *FSH* සාන්ද්‍රනය වැඩි වේ.
(4) 14 වන දින වන විට *LH* හා *FSH* සාන්ද්‍රනය අඩු වේ.

26. පහත සඳහන් කුමන අවස්ථාවේ දී වෝල්ට් මීටර් පාඨාංකය උපරිම වේ ද?



(1) (2) (3) (4)


27. කාර්මිකව සෝඩියම් නිස්සාරණය කරනු ලබන්නේ ඩවුන්ස් කෝෂය මගිනි. එහි දී සිදුවන ඔක්සිකරණ ප්‍රතික්‍රියාව වන්නේ,

(1) $2Cl^- \longrightarrow Cl_2 + 2e$ (2) $Cl_2 + 2e \longrightarrow 2Cl^-$
(3) $Na^+ e \longrightarrow Na$ (4) $Na \longrightarrow Na^+ e$

28. ජෙව ගෝලයේ සංවිධාන මට්ටමක් ලෙස සැලකිය **නොහැක්කේ,**

(1) විශේෂය (2) ප්‍රජාව (3) ගහනය (4) පරිසර පද්ධතිය

29. ඕම් නියමය සත්‍යාපනය සඳහා සිසුන් පිරිසක් සිදු කළ ක්‍රියාකාරකමක් අවසානයේ ලැබුණු දත්ත පදනම් කර ගනිමින් අඳින ලද ප්‍රස්තාරය පහත පරිදි විය. ප්‍රස්තාරයේ මෙම හැඩය ලැබීමට හේතුව විය හැක්කේ,



(1) නික්‍රෝම් කම්බි දඟරය දිග වැඩිවීම (2) ලබා දුන් විභව අන්තරය වැඩිවීම
(3) ස්විච්චිය සංවෘත කර වැඩි වේලාවක් තැබීම (4) ඉහත කිසිවක් නොවේ

30. පහත කුමන වායුව භාස්මික ගුණ පෙන්වයි ද?

(1) NH_3 (2) SO_2 (3) CO_2 (4) Cl_2

31. එක්තරා මව්පිය යුවළකට උපන් සියලුම ගැහැණු දරුවන් වර්ණාන්ධතාවයෙන් පෙලුනි. මෙම මව්පිය දෙපළ පිළිබඳ පහත කුමන ප්‍රකාශය ස්ථිර ලෙස කිව හැකි ද?

(1) මව වර්ණාන්ධතාවයෙන් පෙළේ. (2) මව වර්ණාන්ධතාවය සඳහා වාහක වේ.
(3) පියා වර්ණාන්ධතාවයෙන් පෙළේ. (4) මව හා පියා වර්ණාන්ධතාවයෙන් පෙළේ

32. යකඩ මල බැඳීම වැළැක්වීමට ගනු ලබන ක්‍රියාමාර්ග තුනක් පහත දැක්වේ.

- ***A*** යකඩ භාණ්ඩ මත Zn ආලේප කිරීම
- ***B*** මුහුදේ යාත්‍රා කරන නැව්වල බඳෙහි මැග්නීසියම් හා සින්ක් ලෝහ කැබලි පැස්සීම
- ***C*** ආහාර ඇසුරුම්වල දී යකඩ බඳුන් වටා ටින් ආලේප කිරීම

ඉහත ක්‍රම අතරින් කැතෝඩිය ආරක්ෂක ක්‍රම භාවිතා කරනු ලබන්නේ,

(1) ***A*** හා ***B*** පමණි (2) ***B*** හා ***C*** පමණ (3) ***A*** හා ***C*** පමණි (4) ***A,B,C*** සියල්ලම

33. ද්‍රව පීඩනයේ ලක්ෂණ සම්බන්ධ සත්‍ය ප්‍රකාශය කුමක් ද?
(1) විවිධ ද්‍රව වර්ගවල සමාන ගැඹුරක දී ද්‍රව පීඩනය සමාන වේ.
(2) සෑම ද්‍රවයකම එකම පරිමාවේ දී ද්‍රවකඳ මගින් ඇති කරන පීඩන සමාන වේ.
(3) ඕනෑම ද්‍රවයක සෑම දිශාවකට ම ද්‍රව පීඩනය ක්‍රියා කරයි.
(4) ද්‍රව පීඩනය කෙරෙහි ද්‍රවයේ ඝනත්වයේ බලපෑමක් නැත.

34. $3\ CuSO_4 + 2X \longrightarrow X_2(SO_4)_3 + 3\ Cu$
මෙම ප්‍රතික්‍රියාවේ X විය හැක්කේ,
(1) Zn (2) Al (3) Pb (4) Mg

35. මිනිස් මොළයේ කෘත්‍යයන් කීපයක් පහත දැක්වේ

A. දේහ චලන නිසියාකාරව සිදු කිරීම ***B.*** දේහ සමතුලිතතාව පවත්වා ගැනීම
C. හෘත් ස්පන්දන වේගය පාලනය කිරීම


ඒවා අතරින් අනුමස්තිෂ්කයේ කෘත්‍යය/ කෘත්‍ය වන්නේ
(1) ***A*** හා ***B*** පමණි (2) ***B*** හා ***C*** පමණි (3) ***A*** හා ***C*** පමණි (4) ***A,B,C*** සියල්ලම

36. පහත සඳහන් කුමන ප්‍රකාශය නිවැරදි ද?
(1) අතාත්වික, උඩුකුරු, ඌනිත ප්‍රතිබිම්බ උත්තල දර්පණ වලින් පමණක් ඇති වේ.
(2) උත්තල කාචවලින් තාත්වික ප්‍රතිබිම්බ පමණක් ඇති ඇති වේ.
(3) අවතල කාචවලින් අතාත්වික, උඩුකුරු, ඌනිත ප්‍රතිබිම්බ පමණක් ඇති වේ.
(4) තල දර්පණවලින් තාත්වික ප්‍රතිබිම්බ පමණක් ඇති වේ.

37. රූපයේ දැක්වෙන්නේ නිසල ජලය මත පාවෙන ඔරුවක හරස්කඩ රූපයේ දැක්වේ. ඔරුවේ සමතුලිතතාව සම්බන්ධව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. ඔරුව වම් පැත්තට බර වූ විට කොල්ලෑවේ බර මගින් ඇති කරන සූර්ණයෙන් එය සංතුලනය කරයි.

B. ඔරුව දකුණු පැත්තට බර වූ විට කොල්ලෑව මත ඇතිවන උඩුකුරු තෙරපුම මගින් ඇති කරන සූර්ණයෙන් එය සංතුලනය කරයි.



C. ඔරුව නිසලව ඇති විට ඔරුව මත සම්ප්‍රයුක්ත බලය ශූන්‍ය වේ.
මින් සත්‍ය ප්‍රකාශ වන්නේ
(1) ***A*** හා ***B*** පමණි (2) ***B*** හා ***C*** පමණි (3) ***A*** හා ***C*** පමණි (4) ***A,B,C*** සියල්ලම

38. පරිසර හිතකාමී ගොඩනැගිලි භාවිතයේ අවස්ථාවක් ලෙස සැලකිය **නොහැක්කේ,**
(1) නිවෙස් සිසිල් කිරීමට ස්වභාවික වාතන ක්‍රම යොදා ගැනීම.
(2) ශක්ති සංරක්ෂණ ක්‍රමයක් ලෙස වර්ෂා ජලය යොදා ගැනීම.
(3) ආලෝකය ලබා ගැනීමට දිවා ආලෝකයට සංවේදී පහන් භාවිතය.
(4) තාප ශක්තිය ලබා ගැනීමට පීව වායුව යොදා ගැනීම.

39. කෘෂි රසායන ද්‍රව්‍ය භාවිත කරන ගොවි බිමක් අසල ජලාශයක සිදුවිය හැකි වෙනස්කම් අතර පළමුව නිරීක්ෂණය කළ හැකි වෙනස්කම වන්නේ,
(1) මිය ගිය මසුන් සහ අනෙකුත් ජීවීන් මතුපිට පා වීම. (2) ජලාශයේ ජලය කොළ පැහැවීම.
(3) ජලාශය අසලින් අප්‍රසන්න ගන්ධයක් ඇති වීම. (4) ජලාශය කාබනික ද්‍රව්‍යවලින් පිරී යාම.

40. වෙළඳසැල් මඟින් භාණ්ඩ මිළයට ගැනීමේ දී පොලිතීන් බෑග් සඳහා මුදලක් අය කිරීමේ තීරණය වඩාත් ගැලපෙන්නේ අපද්‍රව්‍ය කළමනාකරණයේ දී යොදා ගැනෙන ***4R*** මූලධර්මයේ කුමන අවස්ථාවට ද?
(1) ප්‍රතිචක්‍රීකරණය (2) නැවත භාවිතය
(3) ආදේශක භාවිතය (4) භාවිතය අඩු කිරීම

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	11 ශ්‍රේණිය	විද්‍යාව -II	කාලය நேரம் Time: පැය 03 යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....


අමතර කියවීම් කාලය මි.10

- **පැහැදිළි අත් අකුරෙන් පිළිතුරු ලියන්න.**
- **A කොටසේ ප්‍රශ්න හතරට ම ඇති ඉඩ ප්‍රමාණය තුළ පිළිතුරු සපයන්න.**
- **B කොටසේ ප්‍රශ්න පහෙන් තුනකට පමණක් පිලිතුරු සපයන්න.**
- **පිලිතුරු සපයා අවසානයේ A කොටස සහ B කොටසේ පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.**
- **අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදන්න.**

A කොටස - ව්‍යුහගත රචනා

01. (A) පහත රූපයේ දැක්වෙන්නේ වායුගෝලය තුළ නයිට්‍රජන් චක්‍රීකරණය වන ආකාරයයි.

පහත වගුවේ දැක්වෙන එක් එක් ප්‍රකාශයට ගැලපෙන ඉංග්‍රීසි අක්ෂරය තෝරා ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියන්න



	ප්‍රකාශය	ගැලපෙන ඉංග්‍රීසි අක්ෂරය
(i)	නයිට්‍රීහරණය	
(ii)	ජෛවීය තිරකිරීම	
(iii)	වායුගෝලීය තිරකිරීම	
(iv)	කාර්මික තිරකිරීම	
(v)	ඇමයිනෝකරණය	

(vi) ශාක හා සතුන් තුළ නයිට්‍රජන් පවතින්නේ කුමන සංයෝගයක් ලෙස ද?.....

(vii) මානව ක්‍රියාකාරකම්වල බලපෑම නයිට්‍රජන් චක්‍රයේ තුල්‍යතාව බිඳ දැමීමට හේතු වී ඇත. නයිට්‍රජන් චක්‍රය තුල්‍යතාව බිඳ දැමීමට හේතුවන මානව ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න.

.....


.....

(viii) නයිට්‍රජන් චක්‍රයේ තුල්‍යතාව බිඳවැටීම නිසා ඇතිවන එක් අහිතකර බලපෑමක් සඳහන් කරන්න.

.....

PAST PAPERS WIKI

(B) 2016 වසරේ සිට 2023 වසර දක්වා ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල කාබන්ඩයොක්සයිඩ් විමෝචනය දැක්වෙන ප්‍රස්තාරයක් පහත දැක්වේ.



(i) පුද්ගලයෙකු කාබන් විමෝචනයට දායක වන ක්‍රියාවලි දෙකක් සඳහන් කරන්න.

.....

(ii) අඩුම ඒක පුද්ගල කාබන්ඩයොක්සයිඩ් විමෝචනයක් පෙන්නුම් කරන්නේ කුමන වර්ෂයේ දී ද?

.....

(iii) එම වර්ෂයේ කාබන්ඩයොක්සයිඩ් විමෝචනය අඩුවීමට බලපෑ එක් හේතුවක් ලියන්න.

.....

(iv) ඉදිරි වර්ෂය සඳහා ඒක පුද්ගල කාබන්ඩයොක්සයිඩ් විමෝචනය අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් යෝජනා කරන්න.

.....

.....

02. (A) ඉයුකැරියා අධිරාජධානියට අයත් ජීවී කාණ්ඩ කිහිපයක ලක්ෂණ පහත දැක්වේ.

ජීවී කාණ්ඩය	ලක්ෂණය
A	ඒක සෛලික හෝ පටක නොදරන බහු සෛලිකයින් වේ.
B	කයිටීන් සහිත සෛල බිත්ති දරයි.
C	විවෘත බීජ දරයි.
D	ද්වී ප්‍රස්තර සීලෝමාන්ත්‍රය සහිත අරිය සමිතියක් ඇත.
E	බාහිර කන් පෙති සහිතය. හෘදයේ කුටීර හතරක් ඇති අචලතාපී ජීවීන් වේ.
F	අනාකුල හැඩයක් ඇති අචලතාපී ජීවීන් වේ.
G	සන්ධි සහිත උපාංග ඇත.
H	ත්‍රී ප්‍රස්තර සීලෝමික දේහය තුළ ජලවාහිනී පද්ධතියක් ඇත

ඉහත ලක්ෂණ යොදා ගනිමින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

(i) පෘෂ්ඨවංශී කාණ්ඩයේ ජීවීන් දැක්වෙන ඉංග්‍රීසි අක්ෂර මොනවා ද?

.....

(ii) *G* ජීවී කාණ්ඩය සතු වෙනත් ලක්ෂණයක් ලියන්න.

.....

(iii) ස්වයංපෝෂී ජීවීන් ඇතුළත් කාණ්ඩ දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය/අක්ෂර නම් කර එම ජීවී කාණ්ඩවල නම් ඉදිරියෙන් ලියන්න.

.....

.....

(iv) *D* ජීවී කාණ්ඩයේ පවතින ස්වරූප දෙක නම් කරන්න.

.....

.....

(B) ජීවියෙකු විද්‍යාත්මකව නම් කිරීම සඳහා ද්විපද නාමකරණය භාවිතා කරයි.


(i) ද්විපද නාමකරණයේ දී යොදා ගන්නා සම්මතයන් දෙකක් ලියන්න.

.....

(ii) පොල් ශාකයේ විද්‍යාත්මක නාමය *Cocos nucifera* වේ. මෙහි දැක්වෙන තක්සෝන නම් කරන්න.

.....

(C) බහු සෛලික ජීවියකුගේ දේහය නිර්මාණය වීමේ මූලික අදියර පහත දැක් වේ.



(i) මෙහි දැක්වෙන ඩිම්බ හා ශුක්‍රාණු සෑදීමට අදාළ සෛල විභාජන ක්‍රමය කුමක් ද?

.....

(ii) මෙහි a මඟින් දැක්වෙන ව්‍යුහය කුමක් ද?

.....

(iii) මෙහි දැක්වෙන්නේ මිනිස් දේහය නිර්මාණය වීම නම්, *a* හි අඩංගු වර්ණදේහ සංඛ්‍යාව කොපමණ ද?


.....

(iv) c මඟින් දැක්වෙන ක්‍රියාවලිය කුමක් ද?

.....

(v) නිශ්චිත කාර්යයක් සඳහා විශේෂණය වූ සෛල සමූහයක් b මඟින් දැක්වේ. එය හඳුන්වන නම කුමක් ද?.....

03. (A) ඉටි යනු ඉන්ධනයකි. ඉටි දහනයේ දී පිටවන එල හඳුනාගැනීමට සිසුන් සිදු කළ පරීක්ෂණයක ඇටවුමක් පහත රූපයේ දැක් වේ.



(i) ඉටි දහනය වීම තාපදායක වේ ද? තාප අවශෝෂක වේ ද? .....

(ii) p ලෙස දැක්වෙන ද්‍රව්‍ය මොනවා ද?

.....

(iii) ඉටි දහනයවන විට p ද්‍රව්‍යයේ දැකිය හැකි නිරීක්ෂණය කුමක් ද?

.....

(iv) ඉක්මනින් නිරීක්ෂණ ලබා ගැනීමට p ද්‍රව්‍යයේ සිදු කළ යුතු වෙනස්කම කුමක් ද?

.....

(v) p හි ලැබෙන නිරීක්ෂණ මත හඳුනාගත් ඉටිවල දහන ඵලය කුමක් ද? .....

(vi) q හි දැකිය හැකි වෙනස්කම කුමක් ද? .....

(vii) q හි වෙනස්කමක් ඇති කිරීමට සමත් වූ දහන ඵලය කුමක් ද? .....

(viii)එම දහන ඵලයෙහි ඇති රසායනික බන්ධන වර්ගය කුමක් ද?.....

(B) ***P,Q,R,S*** නම් ලෝහ ඇල් ජලය, උණු ජලය, හුමාලය හා තනුක HCl සමග ප්‍රතික්‍රියා කරන ආකාරය පහත දැක් වේ.

P - ඇල් ජලය හා උණු ජලය සමග ප්‍රතික්‍රියා නො කරයි. හුමාලය සමග ප්‍රතික්‍රියා කරයි. තනුක HCl සමග සෙමෙන් ප්‍රතික්‍රියාා කරයි.

Q - ඇල් ජලය සමග වේගයෙන් ප්‍රතික්‍රියා කරයි. තනුක HCl සමග ප්‍රචණ්ඩ ලෙස ප්‍රතික්‍රියා කරයි.

R - ඇල් ජලය, උණු ජලය, හුමාලය හෝ තනුක HCl සමග ප්‍රතික්‍රියා නොකරයි.

S - ඇල් ජලය සමග ප්‍රතික්‍රියා නොකරයි. උණු ජලය හා හුමාලය සමග ප්‍රතික්‍රියා කරයි. තනුක HCl සමග ප්‍රතික්‍රියා කරයි.

(i) ***P,Q,R,S*** මූලද්‍රව්‍ය ඒවායේ සක්‍රියතාව ආරෝහණයවන පිළිවෙළට දක්වන්න.

.....


(ii) (a) ඉහත ***P,Q,R,S*** අතරින් ආවර්තිතා වගුවේ පරමාණුක ක්‍රමාංකය 1-20 අතරට අයත් වීමට වඩාත් ඉඩ ඇති මූලද්‍රව්‍ය කුමක් ද? .....

(b) ඒ අතරින් විද්‍යුත් සෘණතාව අඩුම මූලද්‍රව්‍ය කුමක් ද? .....

(iii) S ආවර්තිතා වගුවේ තුන්වන ආවර්තයේ මූලද්‍රව්‍යයක් නම් ***S*** හුමාලය සමග දක්වන ප්‍රතික්‍රියාවේ තුලිත රසායනික සමීකරණය ලියන්න.

.....

04.(A) ආකිමිඩිස් නියමය ආදර්ශනය සඳහා සිසුන් විසින් සිදුකළ පරීක්ෂණයක පියවර කිහිපයක් පහත රූප සටහන්වල දැක්වේ.



(i) ඉහත ක්‍රියාකාරකමේ දී ලැබුණු තරාදි පාඨාංක 5 N ,10 N, හා 7 N වේ. එක් එක් තරාදි සඳහා ගැලපෙන නිවැරදි පාඨාංකය තෝරා ලියන්න.

A - .....

B - .....

C - .....

(ii) පිටාර ගිය ජලයේ ස්කන්ධය 500 g නම් වස්තුව මත ඇති වූ උඩුකුරු තෙරපුම කොපමණ ද?

.....

(iii) ඉහත ගණනය සඳහා යොදාගත් නියමය කුමක් ද? .....

(iv) ඉහත ලී කුට්ටිය වෙනත් තරලයකට දැමූ විට පාවේ.

(a) ඉහත යොදාගත් තරලය හා ජලය සමාන පරිමා ගත් විට වැඩි ස්කන්ධයක් ඇත්තේ ජලයේ ද? එම තරලයේ ද?


.....

(b) ඔබගේ පිළිතුරට හේතුව කෙටියෙන් පැහැදිලි කරන්න.

.....

.....

(B) ස්කන්ධය 1000 kg වූ මෝටර් රථයක් සරල රේඛීය මාර්ගයක චලිත වීමට අදාල ප්‍රවේග කාල ප්‍රස්තාරය පහත දැක් වේ.



(i) රථය මත අසංතුලිත බලයක් ක්‍රියා නොකරන කාල පරාසය කුමක් ද?

.....

(ii) 0-20 s අතර කාලයේ දී රථයේ ගම්‍යතාවය ගණනය කරන්න.

.....

.....

(iii) මන්දනය වන අවස්ථාවේ රථය මත චලිතයට විරුද්ධව ක්‍රියා කරනු ලබන සම්ප්‍රයුක්ත බලය කොපමණ ද?

.....

.....

(iv) මෝටර් රථයක ගමන් කිරීමේ දී ආසන පටි පැළඳ සිටීම ආරක්ෂක ක්‍රමෝපායකි. ආසන පටිය මගින් ආරක්ෂාව ඇති වන අන්දම කෙටියෙන් පැහැදිලි කරන්න.


.....

.....

2B කොටස

- **අංක 5, 6, 7, 8 හා 9 යන ප්‍රශ්නවලින් ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

05. (A) රූපයේ දැක්වෙන්නේ මිනිසාගේ නයිට්‍රජනීය බහිස්ස්‍රාවී පද්ධතිය තුළ හමුවන මුත්‍රා නිපදවීමට හැඩගැසුණු ව්‍යුහයකි.



(i) මෙම ව්‍යුහය හඳුන්වන නම කුමක් ද?
(ii) බහිස්ස්‍රාවය යනු කුමක් ද?
(iii) රූපයේ A හා B කොටස් නම් කරන්න,
(iv) A ලෙස දැක්වෙන කොටසින් පෙරී යන තරලයේ අඩංගු සංඝටක දෙකක් ලියන්න,
(v) ඉහත ව්‍යුහය තුළ සිදුවන වරණීය ප්‍රතිශෝෂණය යන්න කෙටියෙන් හඳුන්වන්න,
(vi) නිරෝගී වැඩිහිටි පුද්ගලයෙකුගේ රුධිරයේ පවතින නමුත් මුත්‍රාවල අඩංගු විය නොහැකි සංඝටක දෙකක් ලියන්න.

(B) රූප මඟින් පෙන්වා ඇත්තේ බාහිර ලක්ෂණ අනුව වර්ග කළ භූගත කඳන් කිහිපයකි.



(i) A හා B භූගත කඳන් හඳුන්වන නම් ලියන්න.
(ii) භූගත කඳක් මගින් ඉටුකරන කාර්යයන් දෙකක් ලියන්න.
(iii) (a) භූගත කඳ හැර වර්ධක ප්‍රජනනය ඉටු කරන වෙනත් ශාක කොටස් දෙකක් නම් කරන්න.
(b) ඔබ නම් කළ කොටස් මගින් වර්ධක ප්‍රජනනය සිදුවන ශාක සඳහා උදාහරණ එක බැගින් ලියන්න.
(iv) ශාකවල කෘත්‍රිම වර්ධක ප්‍රචාරණයේ වාසියක් හා අවාසියක් ලියන්න.

(C) ප්‍රතික ක්‍රියාවක දී ආවේග ගමන් ගන්නා මාර්ගය ප්‍රතික චාපය ලෙස හැඳින්වේ. එය ස්නායු පද්ධතියේ කෘත්‍යමය ඒකකය යි.
(i) ස්නායු පද්ධතියේ ව්‍යුහමය ඒකකය කුමක් ද?
(ii) ප්‍රතික ක්‍රියාවක් යනු කුමක් ද?
(iii) ප්‍රතිග්‍රාහකයේ සිට කාරකය දක්වා වූ ප්‍රතික චාපය ගැලීම් සටහනක් ලෙස අනුපිළිවෙළින් ලියන්න.

06. (A) ලෝහ නිස්සාරණය කිරීමට විවිධ ක්‍රම යොදා ගනී. යකඩ නිස්සාරණයේදී භාවිත කරන්නේ යපස් වේ. යපස් යනු යකඩ අඩංගු සංයෝග සහිත පස් වේ.

(i) යපස්වල අඩංගු ප්‍රධාන රසායනික සංයෝගය කුමක් ද?
(ii) යකඩ නිස්සාරණයට යොදා ගන්නා අනෙකුත් සංඝටක දෙක නම් කරන්න.
(iii) CO මඟින් යකඩ ඔක්සිහරණය වන අයුරු දැක්වීමට තුලිත රසායනික සමීකරණය ලියන්න.
(iv) ලෝබොර නමින් හඳුන්වන ද්‍රව්‍යයක් ලියන්න.
(v) ලෝබොර ද්‍රව යකඩ මත පාවේ. මේ නිසා යකඩ නිස්සාරණයේ දී ඇතිවන වාසිය කුමක් ද?
(vi) යකඩ මල බැඳීම සඳහා අත්‍යවශ්‍ය සාධක මොනවා ද?
(vii) යකඩ මල බැඳීම පාලනය කිරීමට ගත හැකි එකිනෙකට වෙනස් ක්‍රියා මාර්ග දෙකක් ලියන්න.
(viii) යපස් 1 kg ඔක්සිහරණය කළ විට ලැබුණු පිරිසිදු යකඩ ප්‍රමාණය 560 g ක් විය. එම යපස් නියැදියේ තිබූ අපද්‍රව්‍ය ස්කන්ධය ගණනය කරන්න. (Fe =56 ,O = 16)


(B) ආහාර සඳහා රසකාරකයක් ලෙස එකතු කරනු ලබන ලුණු නිෂ්පාදනය කරනු ලබන්නේ ලුණු ලේවායන් තුළ ය.

(i) ලුණු ලේවායක දී මුහුදු ජලයෙන් ලුණු වෙන් කරගන්නා ශිල්ප ක්‍රම මොනවා ද?
(ii) ලුණු ලේවායක් පිහිටුවීමේ දී සලකා බැලිය යුතු භූගෝලීය හා පාරිසරික සාධක දෙකක් ලියන්න.
(iii) ලුණු ලේවායක පළමු හා දෙවන තටාකවල අවක්ෂේප වන ද්‍රව්‍ය පිළිවෙලින් ලියන්න.
(iv) කෑමට ගන්නා ලුණුවල බොහෝ විට ක්ෂුද්‍ර ප්ලාස්ටික් අඩංගු බව මෑතකදී සොයා ගන්නා ලදී. ලුණුවලින් ක්ෂුද්‍ර ප්ලාස්ටික් වෙන්කර, පිරිසිදු ලුණු ලබා ගත හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

07. (A) සිසුවෙකු විසින් නිවසේ දී වීදුරු අත්කාචයක් යොදා ගනිමින් ඉතා කුඩා අකුරු සහිත ලේබලයක් කියවන ලදී.

(i) අත් කාචය ලෙස භාවිත වන්නේ කුමන වර්ගයේ කාච ද?
(ii) කුඩා අකුරු විශාල කර කියවීමට ලේබලය තැබිය යුත්තේ කාචය හා සම්බන්ධ කුමන ලක්ෂ්‍ය අතර ද?
(iii) (a) ඉහත කාචය භාවිත කර ඈත පිහිටි වස්තුවක ප්‍රතිබිම්බය ලබාගන්නා ආකාරය දැක්වෙන කිරණ සටහනක් අඳින්න.
(b) එම ප්‍රතිබිම්බයේ ලක්ෂණ දෙකක් ලියන්න.
(c) ඉහත ලක්ෂණ සහිත ප්‍රතිබිම්බ ලබා ගත හැකි දර්පණ වර්ගය නම් කරන්න.

(B) රූපය දැක්වෙන්නේ නිවසක ජලය උණු කර ගැනීම සඳහා ලෝහමය ආවරණයක් සහිත විදුලි කේතලයක් භාවිත කරන ආකාරයයි.



(i) X මඟින් දැක්වෙන රැහැන තුළ අනිවාර්යයෙන් පිහිටන රැහැන් මොනවා ද?
(ii) විදුලි කේතලයේ දී සිදුවන ශක්ති පරිවර්තනය ලියන්න,
(iii) විදුලි කේතලයේ 230 V හා 1000 W ලෙස සඳහන්ව තිබුණි. 1000 W යන්නෙහි අර්ථය කුමක් ද?
(iv) ඉහත කේතලය භාවිතයෙන් $30\ ^0C$ පවතින ජලය 1 kg නටන තෙක් රත් කිරීමට අවශ්‍ය වන තාප ප්‍රමාණය කොපමණ ද?
(ජලයේ විශිෂ්ඨ තාප ධාරිතාව $4200\ J\ kg^{-1}\ ^0C^{-1}$ වේ.)
(v) ජලය නටන තෙක් රත් කිරීමට ගතවන කාලය කොපමණ ද?
(vi) තාපන දඟරය හා Y කොටස සෑදීමට ගනු ලබන ද්‍රව්‍ය සතුව පැවතිය යුතු භෞතික ගුණයක් බැගින් සඳහන් කරන්න.
(vii) විදුලි කේතලයට විදුලිය ලබාදීමට කෙවෙනියට සවිකිරීම සඳහා වඩාත් සුදුසු වන්නේ දෙකුරු පේනුව ද? තුන්කුරු පේනුව ද? ඔබේ පිළිතුරට හේතුව පැහැදිලි කරන්න.

08. (A) පහත දක්වා ඇත්තේ ශාක හා සත්ත්ව දේහය තුළ සිදුවන ක්‍රියාවලි කිහිපයකි.

- (A) සෛලීය ස්වසනය
- (B) ප්‍රභාසංස්ලේෂණය
- (C) ජල පරිවහනය
- (D) සමස්ථිතිය

(i) A හා B ක්‍රියාවලි සිදුවන ඉන්ද්‍රියිකා නම් කරන්න.
(ii) A හා B ක්‍රියාවලිහි දී නිපදවෙන එක් සංඝටකයක් බැගින් ලියන්න.
(iii) සමස්ථිතිය යනු කුමක් ද?

Past Papers Wiki

(iv) ශාකවල ජල පරිවහනය සඳහා දායකවන පටකය කුමක් ද?

(v) මිනිසාගේ රුධිරයේ ග්ලූකෝස් සාන්ද්‍රණය වැඩි වූ විට එය නියමිත මට්ටම දක්වා අඩුකර ගැනීම සිදුවන ආකාරය කෙටියෙන් ලියන්න.

(B) තැලසීමියාව යනු මිනිසාට වැළඳෙන ජාන විකෘති නිසා ඇතිවන ප්‍රවේණික ආබාධයකි.


(i) තැලසීමියාව රෝගීන්ගේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණය කුමක් ද?

(ii) තැලසීමියා රෝගය සඳහා නිරෝගී ජානය T ද රෝගී ජානය t ද නම්, පහත අවස්ථා සඳහා ප්‍රවේණි දර්ශ ලියන්න.

(a) නිරෝගී වාහක නොවන (b) නිරෝගී වාහක (c) රෝගී

(iii) තැලසීමියාව නිරෝගී වාහක මවක් හා වාහක පියකුට දාව උපදින දරුවන් ගේ ප්‍රවේණි දර්ශ පනට් කොටුවක් ඇසුරෙන් දක්වන්න.

(C) 240 V ප්‍රත්‍යාවර්තක ධාරාවක් 6 V සරල ධාරාවක් බවට පත්කිරීමට යොදාගන්නා උපාංග ඇතුලත් ඇටවුමක් පහත දැක් වේ.



(i) A, B හා C වලින් දක්වා ඇති උපාංග නම් කරන්න.

(ii) ප්‍රත්‍යාවර්ත ධාරාවක් සරල ධාරාවක් බවට පත්කිරීමේ ක්‍රියාවලිය හඳුන්වන නම කුමක් ද?


(iii) A හි ප්‍රාථමික දඟරයේ හා ද්විතීයික දඟරයේ පොට අතර අනුපාතය කොපමණ ද?

(iv) C හි කාර්යය කුමක් ද?

(v) බල්බය තුළින් ගලන ධාරාව කාලය සමඟ වෙනස්වීම දැක්වීමට දළ ප්‍රස්ථාරයක් අඳින්න,

(vi) ප්‍රාථමික දඟරයට ලබාදෙන ශක්තියෙන් කොටසක් පමණක් ද්විතීයික දඟරයට ලැබෙන බව ශිෂ්‍යායෙක් ප්‍රකාශ කරයි. එසේනම් ඉතිරි ශක්තියට කුමක් සිදුවේ ද?

09. (A) විද්‍යුත් කෝෂ හා විද්‍යුත් විච්ඡේදනය ආදර්ශනයට සැකසූ පද්ධති දෙකක් රූපයේ දැක්වේ.



(i) *A* හා *B* කෝෂ දෙකෙන් විද්‍යුත් විච්ඡේදන කෝෂය නම් කරන්න.

(ii) වායු බුබුළු පිටවීම හැර ඉහත කෝෂ දෙකෙ හි දැකිය හැකි වෙනත් නිරීක්ෂණයක් බැගින් වෙන වෙනම ලියන්න.

(iii) ***A*** කෝෂයේ ඇනෝඩය හා කැතෝඩය නම් කරන්න.


(iv) ***B*** කෝෂයේ ධන හා සෘණ ඉලෙක්ට්‍රෝඩ *X* හා *Y* අතරින් තෝරා ලියන්න.

(v) ***B*** හි ඉලෙක්ට්‍රෝඩ ලෙස මිනිරන් කුරු යොදා ගැනීමට හේතුව කුමක් ද?

(vi) ***B*** කෝෂයේ සිදුවන කැතෝඩ ප්‍රතික්‍රියාව ලියන්න.

(vii) විද්‍යුත් විච්ඡේදනය කාර්මිකව යොදාගන්නා අවස්ථාවක් සඳහා උදාහරණ ලියන්න.

(B) ට්‍රාන්සිස්ටරය වර්ධකයක් ලෙස යොදාගත් අවස්ථාවක් පහත පරිපථ සටහනින් දැක්වේ.



(i) මෙහි දී යොදාගෙන ඇත්තේ කුමන වර්ගයේ ට්‍රාන්සිස්ටරයක් ද?

(ii) ට්‍රාන්සිස්ටරයේ ***X, Y, Z*** අග්‍ර නම් කරන්න,

(iii) වර්ධක පරිපථය පරීක්ෂා කිරීමට මයික්‍රෆෝනයක් හා ශබ්ද විකාශකයක් යොදා ගනී.

(a) මයික්‍රෆෝනය හා ශබ්ද විකාශකය සම්බන්ධ කළ යුතු අග්‍ර ***P, Q*** හා ***R, S*** අතරින් තෝරා ලියන්න.

(b) මයික්‍රෆෝනය වෙත ලැබෙන ධ්වනි තරංගය විද්‍යුත් සංඥාවක් බවට පරිවර්තනය කරන සංසිද්ධිය කුමන නමකින් හැඳින්වේ ද?

(c) මයික්‍රෆෝනයට ලබාදෙන සංඥාව හා සම්බන්ධ කුමන භෞතික රාශිය වර්ධක පරිපථය මගින් වර්ධනය කෙරේ ද?

(iv) මෙහි ප්‍රතිරෝධකය හා ධාරිත්‍රකය යොදා ගැනීමට හේතු වෙන වෙනම සඳහන් කරන්න.

***

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank